## පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

### ඉංග්‍රීසි ලඝුලේඛක තනතුරු 02

පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයට ඉංග්‍රීසි ලඝුලේඛක තනතුරු 02 ක් සඳහා බඳවා ගැනීමට ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

ඉංග්‍රීසි ලඝුලේඛක - (අනියම් පදනම)

1. *අධ්‍යාපන සුදුසුකම් :*
   (i) සිංහල / දෙමළ, ගණිතය හා ඉංග්‍රීසි භාෂාව විෂයයන් සඳහා සම්මාන සහිතව එකවර විෂයයන් 06 කින් අ.පො.ස. (සා.පෙළ) සමත්වී තිබීම. අ.පො.ස (උ.පෙළ) සමත්ව තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.
   (ii) ඉංග්‍රීසි ලඝුලේඛනය විනාඩියකට වචන 80ක වේගයෙන් සටහන් කර ගැනීමට හැකිවිය යුතු ය.
   (iii) ඉංග්‍රීසි භාෂාවෙන් පරිගණක වදන් සැකසුම් හැකියාව තිබිය යුතු ය.

2. *පළපුරුද්ද :*
   (i) ඉංග්‍රීසි ලඝුලේඛනය පිළිබඳ සහතිකයක් ලබා තිබීම,
   (ii) පරිගණක වදන් සැකසුම් පිළිබඳ සහතිකයක් ලබා තිබීම,
   (iii) රජයේ හෝ පෞද්ගලික ආයතනයක ඉංග්‍රීසි ලඝුලේඛකයකු වශයෙන් සේවය කර තිබීම අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

3. *වයස :*
අවුරුදු 21ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය.

4. *වැටුප :*
   (i) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව අදාළ තනතුරට හිමි දෛනික වැටුප.
   (ii) රජයේ අනුමත ජීවන වියදම් දීමනාව රු. 260.
   (iii) ඊට අමතරව ආයතනයේ අනෙකුත් සේවකයන් සඳහා ගෙවනු ලබන දීමනාවලට සාපේක්ෂව තනතුරට අදාළ දීමනාව.

දැනට රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලබා ඇති නිලධාරීන්ට ද ඉල්ලුම් කළ හැකිය. (මේ සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 9/2007 අනුව ගෙවීම් කරනු ලැබේ.)

ඉල්ලුම්පත් ලේකම්, පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය , අංක 35, සිල්වා පටුමග, රාජගිරිය යන ලිපිනයට 2017.06.30 හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. තනතුරු නාමය ලියුම්කවරයේ ඉහළ වම් කෙලවරේ සටහන් කළ යුතු ය. අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

ලේකම්,
පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය.

අංක 35, සිල්වා පටුමග,
රාජගිරිය.

06-125

Source: Government Gazette (2017.06.02)